# <u>ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රණවිරුවන් සඳහා රජයේ ඉඩම් ලබාදීමේ ව්‍යාපෘතිය</u>

01. රණවිරුවන් වෙත බෙදා දිය හැකි රජයේ ඉඩම් යම් ප්‍රමාණයක් ආරක්ෂක අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇත. හඳුනාගෙන ඇති ඉඩම් පිළිබඳව තොරතුරු ආරක්ෂක අමාත්‍යාංශයේ සන්නද්ධ හමුදා සුභ සාධන අංශය (දුරකථන අංකය 011 2430860 ) ඇමතීමෙන් ලබා ගත හැකිවේ.

02. ලබාගත හැකි රජයේ ඉඩම් කොටසක් පිළිබඳව ඉඩම් අපේක්ෂිත රණවිරුවා විසින්ද හඳුනාගත හැකිවේ.

03. ඉඩම් නොමැති රණවිරුවන් සහ ඉඩම් අවශ්‍යතාවය ඇති රණවිරුවන් හට ඉඩම් අයදුම් පත්‍රය, අදාළ හමුදාවේ/ පොලීසියේ/ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සුභසාධක අංශ මඟින් හෝ ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් (www.defence.lk) ලබාගත හැකිය.

04. ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2021/01 චක්‍රලේඛයට අනුව පදිංචියට ඉඩමක් නොමැති 2009.06.01 දිනට පෙර සේවයට බැඳී ඇති රණවිරුවන්ට හා මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ට මේ සඳහා අයදුම් කළ හැකි අතර 2009.06.01 දිනට පසුව සේවයට බැඳී ඇති රණවිරුවන්ට ද සාමාන්‍ය බදු ක්‍රමය යටතේ රජයේ ඉඩමක් ලබාගැනීම සඳහා අයදුම් කළ හැකිවේ.

05. ඉඩම් අයදුම්පත සම්පූර්ණ කර අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිළධාරීගේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිර්දේශ සහිතව පහත සඳහන් කාණ්ඩවලට අයත් රණවිරුවන් ඔවුන්ට අදාළ ආයතන වෙත යොමු කළ යුතුවේ.

| රණවිරුවා අයත් කාණ්ඩය | ආයතනය | යොමු කළයුතු ලිපිනය | ෆැක්ස් අංකය | විද්‍යුත් තැපැල් ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|---|
| ක්‍රියාන්විත හේතූන් මත මියගිය හා ආබාධිත ප්‍රතිශතය 100% වන පූර්ණ ආබාධිත රණවිරුවන් | රණවිරු සේවා අධිකාරිය | සභාපති,<br>රණවිරු සේවා අධිකාරිය,<br>අංක 449, ගාලු පාර,<br>කොළඹ 03. | 011 2055671 | ranaviruseva@gmail.com | 011205 5673, 76 |
| යුධ හමුදාවේ සේවයේ නියුතු රණවිරුවන් | යුධ හමුදා සුභ සාධක අධ්‍යක්ෂ මණ්ඩලය | අධ්‍යක්ෂ,<br>යුධ හමුදා සුභ සාධක අංශය,<br>යුද්ධ හමුදා මූලස්ථානය,<br>ශ්‍රී ජයවර්ධනපුර,<br>කොළඹ. | - | dwelfare@army.lk | 011 2514992 |
| යුධ හමුදාවේ ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය, අර්ධ වශයෙන් ආබාධිත හා විශ්‍රාමික රණවිරුවන් | රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය | අධ්‍යක්ෂ, රණවිරු සේවා අධ්‍යක්ෂක මණ්ඩලය,<br>යුද්ධ හමුදා මූලස්ථානය,<br>ශ්‍රී ජයවර්ධනපුර,<br>කොළඹ. | 011 2514842 | dva@army.lk | 011 4051139,40 |

| | | | | | |
|---|---|---|---|---|---|
| නාවික හමුදාවේ සියලුම රණවිරුවන් | නාවික හමුදා සුභ සාධක අංශය | අධ්‍යක්ෂ, නාවික හමුදා සුභ සාධක අංශය, නාවික හමුදා මූලස්ථානය, කොළඹ. | 011 2395057 | dnw@navy.lk | 0117192530<br>0117192525 |
| ගුවන් හමුදාවේ සියලුම රණවිරුවන් | ගුවන් හමුදා සුභ සාධක අංශය | අධ්‍යක්ෂ, ගුවන් හමුදා සුභ සාධක අංශය, ගුවන් හමුදා මූලස්ථානය, තැ. පෙ. 594, කොළඹ. | 011 2441044<br>0112495495 | slafwelfare@gmail. com | 011 2340436 |
| පොලිස් සේවයේ සියලුම රණවිරුවන් | පොලිස් සුභසාධක කොට්ඨාශය | අධ්‍යක්ෂක, පොලිස් සුභසාධක කොට්ඨාශය, නො.78, මුක්තාර් ප්ලාසා ගොඩනැගිල්ල, ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ 14. | 011 2323075 | dir.welfare@police. gov.lk | 0112323079 |
| සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු වේ සියලුම රණවිරුවන් | සිවිල් ආරක්ෂක සුභ සාධක අංශය | අධ්‍යක්ෂ, සිවිල් ආරක්ෂක සුභ සාධක අංශය, ජය මාවත, කටුබැද්ද, මොරටුව. | 0112650962 | docssbskuhq@gmail.com | 0112044868<br>0112044860 |

06. ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් නිර්දේශ කරන අයදුම්පත් ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කළයුතු අතර එම අයදුම්පත් නිර්දේශ කොට මෙම අමාත්‍යාංශය විසින් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතට යොමු කරනු ලැබේ.

07. නිර්දේශිත අයදුම්පත් ලැබීමෙන් පසු ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩම් කච්චේරි පවත්වා ප්‍රතිලාභීන් තෝරා ගනු ලබන අතර එම ප්‍රතිලාභීන්හට මායිම් පෙන්වාදීම හා තාවකාලික හිමිකම් ලිපි ලබාදීම කරනු ලැබේ.

08. ප්‍රතිලාභියා විසින් හිමිකම් ලිපියේ කොන්දේසි අනුව කඩිනමින් ඉඩම සංවර්ධනයට හා නිවස ඉදිකිරීමට කටයුතු කළ යුතු වන අතර පදිංචියෙන් පසුව බලපත්‍රයක් හෝ දීමනා පත්‍රයක් ලබාදීමට කටයුතු කරනු ලැබේ.